රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ
අංක:7/90

මගේ අංකය:958/1/166 (xxiii) ජී
1990 පෙබරවාරි මස 05 දි
කොළඹ 07, නිදහස් චතුරශ්‍රයේ,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ,
ඒකාබද්ධ සේවා අංශයේදී ය.

අමාත්‍යාංශ ලේකම්වරුන් හා
<u>දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙතය.</u>

## <u>රජයේ ගණකාධිකාරීන්ට ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පිළිගත් ආයතනයක ප්‍රායෝගික පුහුණුව ලැබීම සඳහා නිවාඩු ප්‍රදානය කිරීම.</u>

1980 ජනවාරි 14 වංනි දින අංක:247 දරණ ඒකාබද්ධ සේවා චක්‍රලේඛය වෙනුවට ආදේශකොට 1990 ජනවාරි 1 වංනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02 වාර්ෂිකව රජයේ ගණකාධිකාරී සේවයේ නිලධාරීන් 10 දෙනෙකුට ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පිළිගත් ආයතනයක ප්‍රායෝගික පුහුණුව ලැබීම සඳහා පහසුකම් සලසා දීමට තීරණය කර තිබේ.

03 මේ අනුව සෑම වර්ෂයකම ජනවාරි මස 31 වංනි දින දක්වා (හෝ ජනවාරි 31 වැනි දින රජයේ නිවාඩු දිනයක් නම් ඊලඟට යෙදෙන ප්‍රථම වැඩ කරන දිනය දක්වා )-

i අදාල වර්ෂයේ ජනවාරි 1 වැනි දිනට වයස අවුරුදු 45 ට අඩුවූද,
ii වරළත් ගණකාධිකාරී ආයතනයේ ආවසරික පරීක්ෂණයෙන් සමත්ව ඇත්තාවූද.
iii නිවාඩු අයදුම්කරන අවස්ථාවේදී තනතුරේ ස්ථිර කරනු ලැබ ඇත්තාවූද,

නිලධාරීන්ගෙන් අයදුම්පත් භාරගනු ලැබේ.

04 තෝරා ගන්නා ලද ගණකාධිකාරීවරයකු එසේ ඉල්ලුම් කළවිට ප්‍රායෝගික කාලය සම්පූර්ණ කිරීම සඳහා පහත සඳහන් පරිදි නිවාඩු අනුමත කරනු ලැබේ.

උපාධිධාරීන් වූ රජයේ ගණකාධිකාරීන්ට මුළු කාලය අවුරුදු 03 කි.

i පළමුව එක් අවුරුද්දක වැටුප් සහිත නිවාඩු ද,
ii දෙවනුව මුල් අවුරුද්ද වැටුප් සහිතව සහ දෙවැනි අවුරුද්ද වැටුප් රහිතව යනුවෙන් අවුරුදු දෙකක නිවාඩු ද වේ.

උපාධිධාරීන් නොවූ රජයේ ගණකාධිකාරීන්ට මුළු කාලය අවුරුදු 4 කි.

i පළමුව අවුරුදු දෙකක වැටුප් සහිත නිවාඩු ද,
ii දෙවනුව අවුරුදු දෙකක වැටුප් රහිත නිවාඩු ද වේ.

05 පළමුවර හා දෙවනවර නිවාඩුව අතර අවම වශයෙන් මසකට වැඩි කාලයක් සේවයේ යෙදී සිටිය යුතුය.

06 තෝරා ගන්නා ලද අපේක්ෂිකයන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය පිළිගත් ආයතනයක පුහුණුව ලැබිය යුතුය.

07 නියමිත පුහුණු කාලසීමාව අවසන් කළ පසු. නියමිත කාලසීමාවක් රාජ්‍ය සේවයේ රැඳී සිටින බවට ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව ගිවිසුමකට බැඳීමට නිලධාරීන්ට නියම කරනු ඇත.

08 වාර්ෂිකව අයදුම්පත් නොකැඳවන අතර, මෙයට යාකොට ඇති ආදර්ශය අනුව අයදුම්කරුවන් තමන්ම අයදුම්පත් පිළියෙල කර ඉහත 3 වැනි ජේදයේ දක්වා ඇති නියමිත දිනට මාවෙත ඉදිරිපත් කළ යුතුය.

අ.කලේ/(නීල් ප්‍රනාන්දු)
ලේකම්,
රාජ්‍ය පරිපාලන. පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

**<u>ප්‍රායෝගික පුහුණුව සඳහා රජයේ ගණකාධිකාරීන්ට නිවාඩු.</u>**

01 සම්පූර්ණ නම:-

02 (i) උපන්දිනය:- (ii) 19 ..... ජනවාරි මස 1 වැනි දිනට වයස:-

03 රජයේ ගණකාධිකාරි සේවාවට බැඳුණු දිනය හා දැනට සේවය කරන පන්තිය:-

04 දැනට දරණ තනතුරෙහි ස්ථිර කර තිබේද?:-

05 වරලත් ගණකාධිකාරි ආයතනයේ ආවසරික පරීක්ෂණය සමත්වූ වර්ෂය හා විභාග අංකය:-

06 (අ) උපාධි පරීක්ෂණය සමත්ද?:- (ආ) එසේ නම්,

i සමත්වූ උපාධිය:-

ii වර්ෂය :-

iii විශ්ව විද්‍යාලය:-

07 නිවාඩු ඉල්ලා සිටින කාලසීමාව:- 1 වැටුප් සහිත/ රහිත:-

දිනය අයදුම්කරුගේ අත්සන.

රා.පරි.ප.ස.හා ස්ව./ලේ.,

ඉදිරිපත් කරමි.

නිලධාරියා විසින් ඉහත 2, 3, 4, 5 හා 6 වැනි කොටුවල සඳහන් කර ඇති කරුණු සත්‍ය බැව් සහතික කරමි.

අමාත්‍යාංශ ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියා

දිනය:-: